# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 7 දරන
# ගාලු උරුමය පදනම පනත

---

[සහතිකය සටහන් කළේ 1994 අප්‍රේල් මස 26 දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---


1994 අප්‍රේල් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
**ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

**කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබා ගත හැක.**

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත

**[සහතිකය සටහන් කළේ 1994 අප්‍රේල් මස 26 වන දින]**

එල්. ඩී—ඕ. 39/42

**ගාලු උරුමය පදනම නම් වූ පදනමක් පිහිටුවීම සඳහා ද එහි පරමාර්ථ හා බලතල නිශ්චිතව දැක්වීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

**1.** මේ පනත 1994 අංක 7 දරන ගාලු උරුමය පදනම පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක දී ඒ පනත ක්‍රියාත්මක විය යුතු ය.

### 1 වන කොටස

### ගාලු උරුමය පදනම පිහිටුවීම

**ගාලු උරුමය පදනම පිහිටුවීම.**

**2.** (1) (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) "ගාලු උරුමය පදනම" නම් වූ පදනමක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පදනම වෙත පවරා ඇති නමින් පදනම, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර පදනම විසින් නඩු පැවරීම ද එයට එරෙහිව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**පදනමේ අරමුණු.**

**3.** පදනමේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) ඓතිහාසික නගර මධ්‍යස්ථානයක් ලෙස ද පුරා විද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ද ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම, සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම ;

(ආ) ලිඛිත නීතියේ විධිවිධානවලට යටත්ව, ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය ඇතුළත පිහිටියා වූ ද ඓතිහාසික, සංස්කෘතික හෝ සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති වූ ද යම් නිශ්චල හා චංචල දේපළක් අත්කර ගැනීම, ඇවිම, පවත්වා ගෙන යාම සහ බැහැර කිරීම ;

(ඇ) ගාලු කොටුව හා එහි ඓතිහාසික පසුබිම ඇතුළත පිහිටි නිවාස, ගොඩනැගිලි සහ වෙනත් දේපළ සංරක්ෂණය කිරීමෙහිලා ගාලු කොටුව තුළ පදිංචිකරුවන්ගේ උනන්දුව ප්‍රවර්ධනය කිරීම හා එකී කොටුව සහ එහි ඓතිහාසික පසුබිම සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද එකී කොටුවේ සහ එහි ඓතිහාසික පසුබිමේ ඓතිහාසික, සංස්කෘතික, පුරා විද්‍යාත්මක හා සෞන්දර්ය අංශ සම්බන්ධයෙන් ද එකී කොටුව තුළ පදිංචිකරුවන් අධ්‍යයනය කිරීම ද එකී කොටුව සහ එහි ඓතිහාසික පසුබිම තුළ පිහිටි ඓතිහාසික නිවාස හා ගොඩනැගිලි නැවත තැනීම, අලුත්වැඩියා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, තත්ත්වය උසස් කිරීම, යථා තත්ත්වයට පත් කිරීම හා ඒ නිවාස හා ගොඩනැගිලි යොදා ගැනීමේ නව ක්‍රම සොයා ගැනීම :

(ඈ) ගාලු කොටුව සහ එහි ඓතිහාසික පසුබිම පශ්චාත් භූමියට ඇතුළු වී එහි සිරි නැරඹීම සඳහා පහසුකම් සැලැස්වීම ;

(ඉ) ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය තුළ පදිංචි කරුවන්ගේ සාමාන්‍ය සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) ඉහත කී අරමුණු සියල්ල ම හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් සියලු ක්‍රියා හෝ දේ ඉටු කිරීම.

පදනමේ බලතල.

4. 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පදනමට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) මේ පනත යටතේ හෝ යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍ය කාරයකින් පදනම වෙත සතුවන චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම හා දැරීම සහ ඒ දේපළවලට සම්බන්ධ යම් භාරයකට යටත්ව ඒවා විකිණීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ආ) පදනමට අයත් යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ යම් ව්‍යුහයක් තැනීම හෝ එසේ තැනීමට කටයුතු සැලැස්වීම සහ පදනම වෙත සතු කරනු ලැබ ඇති හෝ පදනම විසින් දරනු ලබන යම් ඓතිහාසික, සංස්කෘතික හෝ පුරා විද්‍යාත්මක වටිනාකමක් ඇති ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් හෝ ස්මාරකයන්, ඒ දේපළට සම්බන්ධ යම් භාරයකින් හෝ අන්‍යාකාරයකින් පැන නැගී ඇති යම් වගකීමකට යටත්ව, ඒ ගොඩනැගිල්ල, ව්‍යුහය හෝ ස්මාරකයන් පාලනය කිරීම, පවත්වාගෙන යාම, පිළියම් කිරීම, අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ ආරක්ෂා කිරීම ;

(ඇ) රජය හෝ යම් පුද්ගලයෙක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් හෝ සංස්ථාපිත නොවන මණ්ඩලයන් වෙනුවෙන් ගාලු කොටුව හෝ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ඇතුළත පිහිටි යම් දේපළක් සම්බන්ධයෙන් දේපළ භාරකරුවන් ලෙස ක්‍රියා කිරීම ;

(ඈ) පදනමෙහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා ද අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඉ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ලැබෙන ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග ලබා ගැනීම හෝ එකතු කර ගැනීම ;

(ඊ) ගාලු කොටුවේ හා එහි ඓතිහාසික පශ්චාත් භූමියෙහි ඉතිහාසය පිළිබඳව පර්යේෂණ භාර ගැනීම හා ඒ පර්යේෂණවලට අරමුදල් සැපයීම හා ඒ පර්යේෂණවල ප්‍රතිඵල පළ කිරීම ;

(උ) පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ, නාගරික සංවර්ධන අධිකාරියේ, ගාලු නගර සභාවේ, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ලංකා සංචාරක මණ්ඩලයේ විධාන වලට යටත්ව, ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය ඇතුළත පිහිටි පොදු පහසුකම් පවත්වාගෙන යාම, වැඩිදියුණු කිරීම, අලුත්වැඩියා කිරීම සහ සංවර්ධනය කිරීම ;

(ඌ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් සාධන පත්‍ර පිළියෙළ කිරීම, ලිවීම, භාර ගැනීම, පිටසන් කිරීම, ගණුදෙනු කිරීම, මිලයට ගැනීම, විකිණීම හා නිකුත් කිරීම සහ යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම ;

(එ) පදනමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, අධ්‍යාපන ආයතන, කෞතුකාගාර, විද්‍යාගාර, පර්යේෂණ මධ්‍යස්ථාන, නිරීක්ෂණාගාර, නවාතැන් සලසන ස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම හා වැඩ මූළු පැවැත්වීම ;

(ඒ) පදනමේ අරමුණු ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මුදල්, ඇප ඇතිව හෝ ඇප නැතිව ණයට ගැනීම ;

(ඔ) ප්‍රයෝජනයට ගෙන නොමැති මුදල් ද ඇතුළුව පදනමට අයත් යම් මුදලක් (87 වන අධිකාරය වන) භාර ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ භාර අරමුදල් ආයෝජනය කිරීම නිත්‍යානුකූල වන සුරැකුම් පත්වල ආයෝජනය කිරීම හෝ ඒ මුදල් ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලදී ගැනීම සඳහා ආයෝජනය කිරීම හෝ ඒ ආයෝජන වෙනස් කිරීම හෝ වහාම වියදම් කිරීමට අවශ්‍ය නොවන මුදල්වල යම් ප්‍රමාණයක් යම් බැංකුවක ස්ථිර තැන්පතු ලෙස යෙදවීම.

5. (1) පදනමේ කටයුතු පරිපාලනය, කළමනාකරණය, පාලනය (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පදනමේ කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

*පදනමේ පරිපාලනය කළමනාකරණ මණ්ඩලය වෙත පැවරිය යුතු බව.*

(2) පදනමේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා මේ පනත මගින් පදනම වෙත පිරිනමන ලද හෝ පනවන ලද හෝ පවරන ලද බලතල, ක්‍රියාත්මක කිරීම ද කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම ද මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීම්වලට අදාළ කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා රීති සෑදීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

6. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන් වන—

(i) පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ii) නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(iii) දකුණු පළාතේ අමාත්‍ය මණ්ඩලයේ සංස්කෘතික කට යුතු පිළිබඳ විෂයය පැවරී ඇති අමාත්‍යවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(iv) ගාලු කොටුව හා එහි ඓතිහාසික පශ්චාත් භූමිය පිහිටියේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ද ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා පත් කරන ලද ප්‍රාදේශීය ලේකම්වරයා ;

(v) ගාල්ල මහ නගර සභාවේ නගරාධිපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(vi) පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(vii) නෙදර්ලන්ත ශ්‍රී ලංකා මිත්‍ර සංගමයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(viii) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ix) මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(x) ජාතික ජලජ සම්පත් ආයතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(xi) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා ;

(xii) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(xiii) මොරටුව විශ්ව විද්‍යාලයේ සේවය කරන, ඒ විශ්ව විද්‍යාලයේ ස්මාරක හා ස්ථානවල ගෘහ නිර්මාණ ශිල්පය ආරක්ෂා කිරීම පිළිබඳ අධ්‍යක්ෂවරයා හෝ ඔහුගේ නාමිකයා ; සහ

(xiv) ගාලු දිස්ත්‍රික්කයේ දිසා ලේකම්.

(ආ) පහත සඳහන් අනිකුත් සාමාජිකයන් එනම්—

(i) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන්" ලෙස සඳහන් කරන ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හය දෙනෙක් ; සහ

(ii) නිල බලයෙන් පත් වූ සාමාජිකයන් විසින් අවුරුදු දෙකකට වරක් තෝරා පත් කර ගන්නා ලද (මෙහි මින් මතු "තෝරා පත් කළ සාමාජිකයන්" වශයෙන් හඳුන්වනු ලබන) තැනැත්තන් හය දෙනෙක්.

(2) (අ) මණ්ඩලයේ සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් දෙදෙනෙකු පිළිවෙලින් සභාපතිවරයා ලෙස ද උප සභාපතිවරයා ලෙස ද තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(ආ) තත් කාර්ය සඳහා උප සභාපතිවරයා අමතන ලිපියකින් සභාපතිවරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එසේම තත් කාර්ය සඳහා සභාපතිවරයා අමතන ලිපියකින් උප සභාපතිවරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ඇ) මණ්ඩලය විසින්, යෝජනා සම්මතයක් මගින්, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා සිය ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(ඈ) අසනීපවීම හෝ වෙනත් අශක්නුතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ නිසා සභාපතිවරයාට හෝ උප සභාපතිවරයාට සිය ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, ඔහුගේ ධුරය සඳහා මණ්ඩලයේ සාමාජිකයන් විසින් වෙනත් සාමාජිකයකු තෝරා පත්කර ගනු ලැබිය හැකි ය.

(ඉ) (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහුගේ මණ්ඩලයේ සාමාජිකත්ව කාල සීමාව විය යුතු අතර උප සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහුගේ සාමාජික කාල සීමාව විය යුතු ය.

(3) මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයකු ම—

(අ) අමාත්‍යවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් ; හෝ

(ආ) අමාත්‍යවරයා වෙත අමතන ලද ලිපියක් මගින් ඔහු ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ; හෝ

සාමාජිකයකු වශයෙන් ධුරය අත්හල යුතු ය.

(4) මණ්ඩලයේ තෝරා පත් කරගනු ලැබූ සෑම සාමාජිකයකු ම—

(අ) මණ්ඩලය විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ; හෝ

(ආ) මණ්ඩලය වෙත අමතා ලද ලිපියක් මගින් ඔහු ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් ; හෝ

සාමාජිකයකු වශයෙන් ධුරය අත්හල යුතු ය.

(5) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු මිය ගිය හෝ ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවක දී එසේ මියගිය හෝ ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු අසනීප වීම නිසා හෝ යම් අශක්නුතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(7) (5) වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු කලින් ඉල්ලා අස්වුවහොත් මිස හෝ මිය යෑම හෝ ඉවත් කරනු ලැබීමෙන් සිය ධුරය අත් හරිනු ලැබුවහොත් මිස හෝ, තමා අනුප්‍රාප්තික වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(8) මණ්ඩලයේ පත් කළ සෑම සාමාජිකයකුම මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, තමා ඒ ධුරයට පත්කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(9) මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු, (3) වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හැර අන්‍යාකාරයකින් ස්වකීය ධුරය අත්හරිනු ලැබුවහොත්, නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(10) මණ්ඩලයේ යම් තෝරා පත් කරගත් සාමාජිකයකු මිය ගිය විට හෝ ඉල්ලා අස්වූ විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට, මිය ගිය හෝ ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට, මණ්ඩලය විසින් වෙනත් තැනැත්තකු තෝරා පත් කරගනු ලැබිය හැකි ය.

(11) මණ්ඩලයේ යම් තෝරාපත් කර ගනු ලැබූ සාමාජිකයකුට, අසනීපවීම නිසා හෝ වෙනත් අශක්නුතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, මණ්ඩලය විසින් ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු තෝරා පත් කර ගනු ලැබිය හැකි ය.

(12) (10) වන උපවගන්තිය යටතේ තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයකු කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මිය යෑමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය අත් හරිනු ලැබුවහොත් හෝ මිස, තමා අනුප්‍රාප්තික වන සාමාජිකයාගේ ඉතිරි ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(13) මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලැබූ සෑම සාමාජිකයකුම මිය යෑම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය අත්හරිනු ලැබුවහොත් මිස, ඒ ධුරයට ඔහු තෝරා පත් කර ගනු ලැබූ දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(14) මණ්ලයේ නිල බලයෙන් පත් වූ සෑම සාමාජිකයකුම, තමා මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් ප්‍රකාරව ද ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

(15) මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන්ම පමණක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හෝ තෝරා පත්කිරීමෙහිලා යම් දෝෂයක් හේතුවෙන් ම පමණක් හෝ මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

7. මේ වගන්තිය මගින් මණ්ඩලය වෙත පවරන ලද බලතල හැර, මේ පනත මගින් මණ්ඩලය වෙත පවරන ලද සියලු බලතල හා පනවන ලද සියලු කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම, මණ්ඩලය විසින් සභාපතිවරයාට හෝ උප සභාපතිවරයාට හෝ පදනමේ යම් නිලධරයකුට හෝ පවරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ සභාපතිවරයාගේ බලතල ආදිය.

8. (1) මේ පනතේ විධිවිධානවලට සහ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයන්ට යටත්ව, පදනමේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් පත් කිරීම සඳහා පදනමට බලය තිබිය යුතු ය. පදනමේ කාර්ය මණ්ඩලය.

(2) පදනමේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම නියෝග මගින් නියම කරනු ලැබිය හැකි බඳවා ගැනීමේ පරිපාටිය හා පත්වීම් දීමේ කාර්ය පරිපාටියට අනුකූලව, පදනම විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට හා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගවලට යටත්ව, පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන, වැටුප් හා වෙනත් පාරිශ්‍රමික ද ඇතුලුව ඔවුන්ගේ සේවයට අදාළ නියම හා කොන්දේසි පදනම විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(4) පදනමේ නිලධරයන් හා සේවකයන්, සේවයෙන් නෙරපීමේ බලතල ද ඇතුළුව පදනමේ විනය පරිපාලනයට යටත් විය යුතු ය.

(5) පදනම විසින් පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ යහපත සඳහා වන අර්ථසාධක අරමුදලක් පිහිටුවනු ලැබ ඒවා පාලනය කරනු ලැබිය හැකි අතර පදනම විසින් එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

ඇතැම් ගිවිසුම්වල කාර්ය සඳහා පදනම වෙත කරන ලද සේවය රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**9.** යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුව වෙත සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් තැනැත්තකු පදනම විසින් සේවයේ නියුක්ත කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් පදනම වෙත ඉටු කරනු ලබන යම් සේවා කාලයක් ගිවිසුම යටතේ ඔහුගේ ඒ බැඳුම් ඉටු කිරීමේ කාර්ය සඳහා, ආණ්ඩුව වෙත ඉටු කරන ලද සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

රජයේ නිලධරයන් පදනමේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**10.** (1) පදනමේ ඉල්ලීම පිට, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සේවය කරන රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන යම් කාල සීමාවකට පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එකී කැමැත්ත අනුව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

(2) පදනමේ ඉල්ලීම පිට (1) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන යම් කාලසීමාවකට පදනමේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එකී කැමැත්ත අනුව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කරනු ලබිය හැකි ය.

(3) පදනමේ කාර්ය මණ්ඩලයට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13(2) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(4) පදනමේ කාර්ය මණ්ඩලයට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරවම පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනා ගමන මණ්ඩල පනතේ 13(3) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

පදනමේ මුද්‍රාව.

**11.** පදනමේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතුය;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය; සහ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, පදනමේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

## II වන කොටස

## මුදල්

12. (1) පදනමට එහිම අරමුදලක් තිබිය යුතු ය. පදනමේ අරමුදල.

(2) පහත සඳහන් මුදල් පදනමේ අරමුදලට බැර කරනු ලැබිය යුතුය :—

(අ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ද පදනමට ලැබිය හැකි මුදල් ; සහ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් පදනමට ලැබිය හැකි සියලු මුදල්.

(3) පදනමේ අරමුදලින් පහත සඳහන් මුදල් ගෙවනු ලැබිය යුතු ය :—

(අ) මේ පනත යටතේ ස්වකීය බලතල ඉටු කිරීමේ දී හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී පදනම විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු මුදල් ; හා

(ආ) මේ පනත විසින් හෝ එය යටතේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල්.

13. (1) පදනමේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට මණ්ඩලය කටයුතු සැලැස්විය යුතු ය. පදනමේ ගිණුම් විගණනය කිරීම.

(2) පදනමේ ගිණුම්, මණ්ඩලය විසින් පත් කරනු ලැබූ සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) පදනමේ මුදල් වර්ෂය, ලින් වර්ෂය විය යුතු ය.

(4) මෙම වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයකු" යන් නෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ (8) ජේදයෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේය.

## III වන කොටස

14. (1) පදනමේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද, කාර්ය ඉටු කිරීමේ දී ද අමාත්‍යවරයා විසින් ලිඛිතව සාමාන්‍ය විධාන දෙනු ලැබිය හැකි අතර මණ්ඩලය විසින් ඒ විධාන බලාත්මක කළ යුතු ය. පදනමට අදාළ අමාත්‍යවරයාගේ බලතල.

(2) අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි තැනැත්තකු හෝ තැනැත්තන් විසින් පදනමේ කටයුතු සියල්ලම හෝ ඉන් යම් කටයුත්තක් විමර්ශනය කර බැලීමට අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් කරනු

ලැබූ කල්හි, ඒ නියමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි සියලු තොරතුරු සැපයීමද සියලු පහසුකම් සැලසීමද මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

**රජයේ ඉඩම් හෝ ගොඩනැගිලි පදනමට ලබා දිය යුතු බව.**

**15.** යම් රජයේ ඉඩමක් හෝ රජයේ ගොඩනැගිල්ලක්, තත්කාලයේ රජයේ ඉඩම් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව, පදනමේ ප්‍රයෝජනය පිණිස ලබාදීම හෝ පදනමේ යම් කාර්යයක් සඳහා නියාදනය කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

**පදනමේ කටයුතු පිළිබඳ වාර්තාවක් පදනම විසින් ඉදිරිපත් කළ යුතු බව.**

**16.** පදනමේ එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හයක කාලසීමාවක් ඉකුත් වීමට පෙර, ඒ වර්ෂය තුළ පදනමේ කටයුතුවල සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කරන වාර්තාවක් පදනම විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර අමාත්‍යවරයා විසින් එහි පිටපත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**අල්ලස් පනතේ අර්ථානුකූලව පදනම උපලේඛනගත ආයතනයක් විය යුතු බව.**

**17.** අල්ලස් පනතේ අර්ථානුකූලව පදනම උපලේඛනගත ආයතනයක් විය යුතු අතර, ඒ පනතේ විධිවිධාන එපරිද්දෙන් තේරුම් ගත යුතු ය.

**සාමාජිකයන් හා සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.**

18. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා පදනමේ සියලු සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**මේ පනත යටතේ කරනු ලබන ක්‍රියාවලට ආරක්ෂාව සැලසීම.**

**19.** (1) (අ) මේ පනත යටතේ පදනම විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරනු ලැබූ බවට අදහස් කරන ලද යම් ක්‍රියාවක් සඳහා පදනමට එරෙහිව ; සහ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු, පදනමේ නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා

කිසිම සිවිල් නඩුවක් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ පදනම විසින් හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් හෝ සිදු කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට පදනමට එරෙහිව හෝ ඒ තැනැත්තාට එරෙහිව පවරා ඇති යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩු කටයුත්තක දී පදනම විසින් හෝ ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, එකී ක්‍රියාව සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් බවට අධිකරණය තීරණය කරනු ලබන්නේ නම්, පදනමේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

20. මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යම් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :— නියෝග.

(අ) පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාරිශ්‍රමික ද ඇතුළුව, ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම හා සේවා කොන්දේසි ;

(ආ) පදනමේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ බඳවා ගැනීමේ පරිපාටි සහ පත් කිරීම් පිළිබඳ කාර්ය පරිපාටි ;

(ඇ) පදනමේ වැඩ පිළිවෙල සහ යෝජනා ක්‍රම, වාර්ෂික අයවැය වාර්තා සහ ගිණුම් ද ඒ වැඩ පිළිවෙල සහ යෝජනා ක්‍රම, වාර්ෂික අයවැය වාර්තා සහ ගිණුම් පිළියෙල කළ යුතු ආකාරය ; සහ

(ඈ) මේ පනත මගින් නියම කිරීමට නියමිත වෙනත් යම් කරුණු හෝ මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දී ඇත්තේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ කරුණු.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් අනනුමතයේ දින සිට අවලංගු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ නියෝගය යටතේ, කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

21. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ— අර්ථ නිරූපණය

"මධ්‍යම සංස්කෘතික අරමුදල" යන්නෙන් 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත මගින් පිහිටුවනු ලැබූ මධ්‍යම සංස්කෘතික අරමුදල අදහස් වේ;

"ලංකා සංචාරක මණ්ඩලය" යන්නෙන් 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩලය පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා සංචාරක මණ්ඩලය අදහස් වේ ;

"සභාපතිවරයා" යන්නෙන් මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ :

"අමාත්‍යවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබුවා වූ ද සංස්කෘතික කටයුතු පිළිබඳ විෂයය පවරනු ලැබුවා වූ ද අමාත්‍යවරයා අදහස් වේ;

"ජාතික ජලජ සම්පත් නියෝජිත ආයතනය" යන්නෙන් 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් නියෝජිත ආයතන පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික ජලජ සම්පත් නියෝජිත ආයතනය අදහස් වේ;

"ශ්‍රී ලංකා වරාය අධිකාරිය" යන්නෙන් 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරිය අදහස් වේ;

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන් 1979 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ;

"උප සභාපතිවරයා" යන්නෙන් මණ්ඩලයේ උප සභාපතිවරයා අදහස් වේ.

---

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.